**ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගිවිසුම් ප්‍රකාර නියමිත දිනට මධ්‍යස්ථානය වෙත බෝට්ටු එන්ජින් සපයා නොතිබීම හේතුවෙන් මධ්‍යස්ථානය විසින් අයකරගෙන තිබුණු රු.මිලියන 1.82 ක් වූ ප්‍රමාද ගාස්තුව අදාල වත්කම්වල පිරිවැයට හිලව්කර පෙන්වා තිබීම හේතුවෙන් වත්කම්වල වටිනාකම එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | බෝට්ටු එන්ජින් මිලදී ගැනීම සඳහා වැය වූ සත්‍ය වියදම් වන්නේ ඒ සඳහා අප විසින් මුදලින් ගෙවූ අගයයි. ඒ අනුව එම බෝට්ටු එන්ජින් සැපයුම්කරු වෙත මුදල් ගෙවීමේදී සැපයුම් ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 1.82 අඩුකර ගෙවා මුදල නිවැරදිව සටහන් කිරීම අප විසින් සිදුකර තිබේ. | වත්කම්වල සාධාරණ වටිනාකම ගිණුම්වල නිරූපණය කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| (ආ) 2018 දෙසැම්බර් 31 මධ්‍යස්ථානය වෙත භෞතිකව ලැබී නොතිබුනු පිරිවැය රු.මිලියන 4.49 ක් වූ මහජන ඇමතුම් කට්ටල 29 ක් හා පිරිවැය රු.975,000 ක් වූ හෙඩ් සෙට් 25 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ කාර්යාල උපකරණ යටතේ වත්කම් වශයෙන් දක්වා තිබුණි. ඉන් පිරිවැය රු.මිලියන 2.8 ක් වූ මහජන ඇමතුම් කට්ටල 17 ක ප්‍රසම්පාදන කටයුතු 2019 ජනවාරි 30 දින අවලංගු කර තිබුණි. | 2018 වර්ෂය අවසානයේදී අප ආයතනයට වෙන්ව තිබූ ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අවශ්‍ය සියළු කටයුතු සිදුකර අදාළ භාණ්ඩ ඇණවුම් ලිපි නිකුත්කර තිබුණි. ඇතැම් භාණ්ඩ, සැපයුම්කරුවන් විසින් එකඟ වූ පරිදි ලබාදීමට අපොහොසත් වීම නිසා අදාළ ඇණවුම් පසුව අවලංගු කිරීමට සිදුවිය. කෙසේවුවද ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | සත්‍ය වශයෙන්ම ලැබී නොතිබුණු වත්කම් ගිණුම්ගත කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවලින් සත්‍ය හා සාධාරණ තත්වයක් නිරූපණය නොවේ. |

### 1.5.2 අනුචිත ඇගැයීම් හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් රු.මිලියන 480 ක ප්‍රතිපාදනයක් සලසාදී තිබුණද ඒ ඒ දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති සම්බන්ධ විස්තර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරි සැලසුම්වල දක්වා නොතිබුණි. 2017 වර්ෂයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 15 ක හිඟ බිල්පත් නිරවුල් කිරීම සඳහා වෙන් කරන ලද රු.මිලියන 20 ක ප්‍රතිපාදනයක් ද ඊට ඇතුලත් වූ අතර රු.මිලියන 22.14 ක් වූ හිඟ බිල්පත් 2018 දෙසැම්බර් 31 දිනට නිරවුල් | මහා භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි ඉකුත් වර්ෂයේ හිඟ මුදල් ගෙවීම සඳහා 2018 වර්ෂයේ ප්‍රතිපාදනය උපයෝජනය කරන ලදී. | (අ) ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති පිළිබඳ විස්තර ක්‍රියාකාරි සැලසුම්වලට ඇතුලත් කිරීම අවශ්‍ය වේ.<br>(ආ) ඉකුත් වර්ෂයට අදාල හිඟ මුදල් පියවීමට අදාල අරමුදල් වෙනම ලබා ගැනීමට හා සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන සැලසුම් වලට අනුව උපයෝගි කර ගැනීමට කටයුතු |

| | | |
|---|---|---|
| කර තිබුණි. කෙසේවෙතත්, මධ්‍යස්ථානයේ ප්‍රගති වාර්තාව අනුව 2018 වර්ෂය වෙනුවෙන් ව්‍යාපෘති 278 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 474.43 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මුදාහැර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට එම ප්‍රතිපාදන වලින් රු.මිලියන 361.49 ක මුදලක් පමණක් උපයෝජනය කර තිබුණි. | | කිරීම මගින් අරමුදල් විචක්ෂණව කළමනාකරණය කිරීමට කටයුතු කළ හැකිවේ. |
| (ආ) වෙන්කරන ලද මුළු ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් නියෝජනය වූ රු.මිලියන 104.97 ක මුදලක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 93 ක් ක්‍රියාත්මක කිරීම සඳහා වෙන් කර තිබීම හේතුවෙන් දිවයිනේ දිස්ත්‍රික්ක අතර ප්‍රතිපාදන වෙන්කිරීම සමගාමී නොවුනු බව නිරීක්ෂණය විය. ගාල්ල දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරිමේ කටයුතු සඳහා තෝරාගන්නා ලද අළුත්වත්ත පාර ඉඩම සංවර්ධනය සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 10 ක ප්‍රතිපාදනය ආපදා අවම කිරිමේ අරමුණුවලට අනුගත නොවු කාර්යයක් බව නිරීක්ෂණය විය. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ පානීය ළිං හා වගා ළිං යථාතත්ත්වයට පත් කිරීමට රු. මිලියන 34 ක පමණ මුදලක් වෙන් කිරීම නිසා අනුරාධපුර දිස්ත්‍රික්කයට වැය කළ ප්‍රතිපාදන ඉහළ ගොස් ඇත. | සත්‍ය වශයෙන්ම ආපදාවන්ට මුහුණදෙන ස්ථාන ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රතිපාදන උපයෝජනය කිරීමට පියවර ගැනීමට අවශ්‍ය වේ. |
| (ඇ) බහුවිධ අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම යටතේ වෙන් කර තිබුණු රු. මිලියන 50 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය තුල රු.මිලියන 20.31 ක් පමණක් වැයකර තිබුණ අතර ඒ සඳහා වූ | පිළිතුරු සපයා නොමැත. | අපේක්ෂිත කාර්යයන් සඳහා ප්‍රතිපාදන උපයෝජනය කිරීමට පියවර ගැනීම අවශ්‍ය වේ. |

සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 59 ක අරමුදල් උපයෝජනය කර නොතිබුණි.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2017 පෙබරවාරි 21 දිනැති අංක 2017/01 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ චක්‍රලේඛය | මහජන විරෝධතා අවම වන පරිදි හා වරින්වර සංශෝධනයන් සිදු කිරීමට අවශ්‍ය නොවන පරිදි ව්‍යාපෘති තෝරා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග සැලසුම් කර අනුගමනය කර නොතිබුණි. | මෙම ව්‍යාපෘති තෝරා ගැනීමේදී මහජන විරෝධතාවන් අවම වන ලෙස ව්‍යාපෘති තෝරාගෙන ඇති බවට දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක, ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්වරයා විසින් සහතික කළ යුතු වේ. ඉදිරියේදී මෙම තත්ත්වය අවම කර ගැනීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි ව්‍යාපෘති තෝරාගැනීමේදී මහජන ඉල්ලීම් සඳහා අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 33.32 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 7.32 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 26.0 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ සේවක පාරිශ්‍රමික වියදම් ඉහලයාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිවල වැඩ අවසන් වූ වහාම අදාල දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් විසින් ගිවිසුම් ප්‍රකාරව සාර්ථකව වැඩ නිම කර තිබෙන බවට වැඩ අවසන් සහතිකය ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක වූ ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 333.92 ක් වූ ව්‍යාපෘති 202 ක වැඩ අවසන් වාර්තා 2018 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීමට අදාළ වාර්තා එවන මෙන් දිස්ත්‍රික් නිලධාරීන් වෙත දැනුම්දී ඇති අතර, 2019 ජුනි 30 දින වන විට ව්‍යාපෘති 125 ක පමණ වැඩ අවසන් වාර්තා ලැබී ඇති අතර, ඉතිරි ව්‍යාපෘතිවල අවසන් වාර්තා ලබා ගැනීමට කටයුතු කොට ඇත. | වැඩ අවසන් කළ බවට වාර්තා ලබාගැනීමට කඩිනම් පියවර ගැනීම මගින් ඒවායේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සංශෝධන සඳහා අවශ්‍ය පියවර 2008 දී ආරම්භ කර තිබුණ ද 2018 දෙසැම්බර් 31 දින වන තෙක් අදාල සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | අදාල පනත සංශෝධනය කිරීමේ කටයුතු ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සිදු කරමින් පවතී. | අදාල පනත කාලීනව සංශෝධනය කර ඊට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම මගින් ආපදා කළමනාකරණ කටයුතුවල නිත්‍යානුකූලභාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) ජාත්‍යන්තරව පිළිගත් සෙන්දායි රාමුව අනුව ආපදා අවදානම අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී මධ්‍යස්ථානයට ලබාදුන් රු.මිලියන 1.3 ක මුදලින් 2017 | සෙන්දායි සැළැස්ම අනුව ආපදා අවදානම් අවම කිරීම සඳහා කෙටුම්පත් කරන ලද උපාය මාර්ගික සැළැස්ම අමාත්‍යාංශය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත 2019 ජුනි මාසයේදී ඉදිරිපත් කොට ඇත. | ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීමට කඩිනමින් කටයුතු කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| දෙසැම්බර් 31 දින වන විට මධ්‍යස්ථානය විසින් රු.318,582 ක් වැය කර තිබුණද එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. උක්ත සැලැස්ම සකස් කිරීමේ කටයුතු අමාත්‍යාංශය විසින් ඉටු කළයුතු බව මධ්‍යස්ථානය විසින් ඉකුත් වර්ෂයේදී මා වෙත දන්වා තිබුණ ද අමාත්‍යාංශය විසින් ද එවැනි සැලැස්මක් පිළියෙල කිරීමට 2018 දෙසැම්බර් 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණි. | | |
| (ඈ) ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන පරිච්ඡේදයේ 2 (අ) පරිදි මධ්‍යස්ථානය විසින් ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම පිළියෙල කළ යුතු අතර ඒ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2017 වර්ෂයේදී රු.මිලියන 02 ක් මධ්‍යස්ථානය වෙත ලබා දී තිබුණි. ඒ අනුව 2018 – 2030 දක්වා වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් නව සැලැස්මක් පිළියෙල කිරීම 2017 මාර්තු 07 දින ආරම්භකර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි. | 2019 ජුනි 30 දින වන විට සකස් කර අවසන්ව ඇති ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ අඩුපාඩු සකස් කිරීම සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීමට කඩිනමින් කටයුතු කිරීම අවශ්‍ය වේ. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් විවිධ වැඩසටහන් 06 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු.මිලියන 3.99 ක මුදලක් සහ සාර්ක් සංවිධානය මගින් අත්තිකාරම් වශයෙන් 2015 වර්ෂයේ ලැබී තිබුණු රු.මිලියන 1.75 ක් අදාල කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | මෙම මුදල් යොදා ගෙන ඉදිරියේදී අදාල කාර්යයන් සිදු කිරීමට කටයුතු පිළියෙල කර ඇත. | අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදනයන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මධ්‍යස්ථානය විසින් ඔරු අඟුල් 80 ක් සපයා ගැනීම සඳහා ආයතන 06 ක් වෙත ලංසු ආරාධනා පත්‍ර යොමුකර තිබුණු නමුත් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි වී නොතිබුණු ආයතන 02 ක් ඒ සඳහා තෝරාගෙන තිබුණි. තවද තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව ඔරු අඟුල් සපයා ගැනීමට තෝරාගත් ආයතන විසින් ඉදිරිපත් කර තිබු පිරිවිතරය ආයතනයේ අවශ්‍යතාවන්ට නොගැලපෙන අවස්ථා 06 ක් හඳුනාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ඡේදය ප්‍රකාරව ඔරු අඟුල් සැපයුම්කරු වෙතින් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගැනීමට කටයුතුකර නොතිබුණු අතර ඒ සඳහා ගිවිසුමකටද එළඹ නොතිබුණි. ප්‍රසම්පාදන | (අ)2018 මැයි මාසයේ සිදු වු ගං වතුර අවදානම හේතුවෙන් ඔරු අඟුල් විශාල ප්‍රමාණයක් අවශ්‍ය වු බැවින් හදිසි මිලදි ගැනීමක් ලෙස මෙම ප්‍රසම්පාදනය සිදු කර ඇත.<br><br>(ආ)මෙවැනි ඔරු අඟුල් නිෂ්පාදනය කරගත හැකි ආයතන සුළු ප්‍රමාණයක් වු බැවින් එම ආයතන වලින් පමණක් මිලදි ගැනීම් කර ඇත.<br><br>(ඇ)තෝරාගත් සැපයුම්කරු 2017 වර්ෂයේදිද සැපයුම් සිදුකර තිබුනු බැවින් කාර්ය සාධන ඇපකර ලබාගෙන නොතිබුණි. | (අ) ප්‍රසම්පාදන අවශ්‍යතාවය කඩිනමින් ඉටුකර ගැනීමට හැකිවන පරිදි සහ විචක්ෂණව අරමුදල් කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය.<br><br>(ආ) පසු කාලීනව උද්ගත විය හැකි නීතිමය ගැටලු අවම කර ගැනීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| ලේඛන වලට අනුව මධ්‍යස්ථානය විසින් නම් කරන ස්ථාන වෙත ඔරු අඟුල් සැපයිය යුතු අතර රු.මිලියන 9.92 ක් වූ එකඟ වූ පිරිවැය තුල ප්‍රවාහන ගාස්තු ද අන්තර්ගත වුවද ප්‍රවාහන ගාස්තු ලෙස රු. 675,155 ක මුදලක් අමතරව වැය කර තිබුණි. | | |
| (ආ) වීඩියෝ දර්ශන පථයක් ප්‍රසම්පාදනය සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලැබී නොතිබියදීත් සාවද්‍ය ලෙස සකස්කර තිබුණු භාණ්ඩ සැපයීම් නියෝගයක් පදනම් කරගෙන වීඩියෝ දර්ශන පථයක් මිලදී ගැනීමට 2018 දෙසැම්බර් 28 දින රුපියල් මිලියන 12 ක් ගෙවීමට චෙක්පතක් පිළියෙල කර තිබුණි. මධ්‍යස්ථානය වෙත 2018 දෙසැම්බර් 31 දින ලැබී තිබුණු මෙම උපකරණ 2019 අප්‍රේල් 30 දින වන විටත් ලේඛන වලට ඇතුලත් නොකර ගබඩාවේ රඳවාගෙන තිබුණි. | ප්‍රසම්පාදන කටයුතුවල අඩුපාඩු පැවති බව පිළිගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුගත විය යුතු අතර අවශ්‍යතාවය කල් තබා නිශ්චය කළ යුතුය. |
| (ඇ) ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 13.95 ක් වූ මහජන ඇමතුම් කට්ටල 149 ක ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ඡේදය අනුව ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණ අතර කාර්ය සාධන සුරක්ෂණයක් ලබාගැනීම වෙනුවට පිළිවිතර වලට අනුකූල | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ජන ඇමතුම් කට්ටල මිලදී ගැනීම අවශ්‍යතාවන් 03 ක් සඳහා වෙන් වෙන් වූ ප්‍රතිපාදන උපයෝගී කොට ගෙන ප්‍රසම්පාදනයන් සිදු කර ඇති අතර ඒ අනුව ජන ඇමතුම් කට්ටල එක් එක් අවශ්‍යතාවයන් සඳහා ඊට අදාළ වූ පිරිවිතරයන්ට අනුකූලව මිලදී ගැනීම සිදුකරන ලදි. එම අවශ්‍යතාවයන් පහත පරිදි වේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ ඇතුලත් උපදෙස් වලට අනුකූලව කටයුතු කිරීමෙන් අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කල යුතුය. |

නොවන ලෙස සපයා තිබුණු මහජන ඇමතුම් කට්ටල 29 ක් ඇපකරයක් ලෙස ගබඩාවේ රඳවා තබාගෙන තිබුණි. 2018 දෙසැම්බර් 31 දින අදාල උපකරණ ගබඩාව වෙත ලැබුණු බව සලකා රු.මිලියන 9.10 ක් ගෙවා තිබුණ ද අදාල උපකරණ 2019 මාර්තු 01 දින වන විටත් ගබඩාවට ලැබී නොතිබුණි

- ජන ඇමතුම් කට්ටල 12ක් පුහුණු හා දැනුවත් කිරීම් අංශය සඳහා
- ජන ඇමතුම් කට්ටල 17ක් දිස්ත්‍රික් ඒකක සඳහා
- ජන ඇමතුම් කට්ටල 120ක් හදිසි මෙහෙයුම් අංශය සඳහා

මෙම මිලදී ගැනීම් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන අධිකාරී සීමාවන් තුළ සිදු කිරීමට හැකි බැවින් ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු අනුගමනය කර ඇත. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:9:3 ට අනුව විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණද මිලට ගැනීමේ ඇණවුම නිකුත් කර ඇත. එහි 5:4:8 භාණ්ඩ (අ) (ආ) ට අනුව අස්ථිත්වයේ කාර්ය සාධන සුරක්ෂණයන් ලබා ගැනීම සිදු නොකරන ලද්දේ සැපයුම්කරු විසින් සැපයුම නිසි කාල සීමාව තුළ සාර්ථකව සම්පූර්ණ කිරීමේ විශ්වාසය පදනම් කර ගෙනය. ඊට අනුව ප්‍රතිචාර දක්වා නොමැති ජන ඇමතුම් කට්ටල 120 ක් සපයන ලද සැපයුම්කරු වෙත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ යොමු අංක 5:4:13 ට අනුව ප්‍රමාද ගාස්තු අය කර ගෙවීම් සිදු කර ඇත. තවද, අදාළ සැපයුම් නිසි වේලාවට සිදු නොකිරීම මත ජන ඇමතුම් කට්ටල 17ට අදාළ ප්‍රසම්පාදනය පසුව අවලංගු කර ඇත.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානය විසින් 2014 සිට 2017 දක්වා වාර්ෂික වාර්තා 2019 අප්‍රේල් 30 දින වන විටත් පාර්ලිමේන්තුවට සභාගත කර නොතිබුණි. | අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට පියවර ගනිමින් පවති. | පාර්ලිමේන්තු කාරකසභාවල නිරීක්ෂණයට ලක් කල හැකි වන පරිදි අදාල වාර්ෂික වාර්තා චක්‍රලේඛ උපදෙස් වලට අනුකුලව සභාගත කිරීම අවශ්‍ය වේ. |

### 4.2 නොවිසඳුනු නීතිමය ගැටළු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෝටර් වාහන 02 ක් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වර්ෂ 05 ක කාල සිමාවක් සඳහා සපයා ගැනීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 11 දින එළඹෙන ලද ගිවිසුම මධ්‍යස්ථානය විසින් ඒක පාර්ශවිකව කඩ කිරීම හේතුවෙන් රු.මිලියන 15 ක වන්දි මුදලක් අයකර ගැනීම සඳහා සැපයුම්කාර ආයතනය විසින් මධ්‍යස්ථානයට විරුද්ධව සමාලෝචිත වර්ෂය තුලදී නඩු පවරා තිබුණි. ඊට අමතරව මධ්‍යස්ථානයට එරෙහිව විවිධ අධිකරණවල නඩු 07 ක් පවරා තිබුණි. | මුල්‍ය ප්‍රකාශන මගින් ඉදිරිපත් කරනු ලබන ආයතනයේ මුල්‍ය තත්ත්වය සහ මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ තීරණ ගැනීමේදී එම මුල්‍ය ප්‍රකාශයන් පරිශීලනය කරනු ලබන්නන්ගේ තීරණ කෙරෙහි මෙම නඩු විස්තර තීරණාත්මක බලපෑමක් නොමැති බව අපගේ හැඟීමයි. | ආයතනය මුහුනපා තිබෙන නීතිමය ගැටලු පිළිබඳව මුල්‍ය වාර්තාවල හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. |
| (ආ)කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රු.මිලියන 1034.0 ක වියදමින් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2010 වර්ෂයේදී | ගොඩනැගිල්ල ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2014 වර්ෂයේ සිට | අයිතිය පවරා ගැනීම මගින් එහි වටිනාකම ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| ඉදිකර තිබුණු නමුත් එම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත නිත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිම කර නොතිබුණි. | ආරම්භ කරන ලදී. ඒ අනුව මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ පිඹුරුපත සකස් කරවා ගැනීමෙන් අනතුරුව අදාල බිම් කොටස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත නිදහස් දීමනා පත්‍රයක් මගින් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන ලදී. | |

## 4.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාලව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී නොතිබුණි. | මේ වන විට අරමුණු හඳුනාගෙන ඇති අතර ඒ සඳහා උපාය මාර්ග සකස් කරමින් පවතී. මේ සම්බන්ධව තිරසර සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කළ අතර උපාය මාර්ග හඳුනාගත් පසු තිරසර සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කර වසර 2030 දක්වා ඊට අදාල වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයතු කරනු ලැබේ. | මේ සම්බන්ධයෙන් ඉක්මන් පියවර ගැනීම අවශ්‍ය වේ. |